# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021.11.16 |


## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2021 ඔක්තෝබර්


### 2021 ඔක්තෝබර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉහළ යන ලදී.

**රටේ නිෂ්පාදන ක්‍රියාකාරකම් ඉහළ වේගයකින් යථාවත් වීම පිළිබිඹු කරමින්, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය මාස 7ක් තුළ ලබාගත් ඉහළම අගය 2021 ඔක්තෝබර් මාසයේදී වාර්තා කරන ලදී.** ඒ අනුව පෙර මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.1කින් ඉහළ යමින් 2021 ඔක්තෝබර් මාසයේදී එම දර්ශකය 60.4ක අගයක් වාර්තා කරන ලදී. නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සියලු උප දර්ශක වල සිදුවූ ඉහළ යාම මේ සඳහා දායක විය.

| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2021 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.1ක ඉහළ යෑමකි |
|---|---|
| **60.4** | |

විශේෂයෙන්ම ආහාර හා පාන නිෂ්පාදන අංශයේ සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම් සහ නිෂ්පාදන වල සැලකිය යුතු ඉහළ යාමක් ඔක්තෝබර් මාසය තුළ දක්නට ලැබුණි. ආහාර හා පාන නිෂ්පාදන අංශයේ බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කළේ, එළඹෙන උත්සව සමයේ ඉල්ලුම ඉලක්ක කර ගනිමින් 2021 ඔක්තෝබර් මාසයේදී දේශීය ඇණවුම් වැඩි වශයෙන් ලැබුණු බවයි. එමෙන්ම, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදකයින්ට ද ඉහළ අපනයන ඇණවුම් ප්‍රමාණයක් ලැබී ඇති බව සඳහන් කරන ලදී. මේ අතර, රට තුළ සංචරණ සීමාවන් ලිහිල් කිරීමත් සමඟ පසුගිය මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසය තුළ සේවා නියුක්තිය ද ඉහළ යන ලදී. කෙසේ වෙතත්, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයෙහි සමහර ප්‍රතිචාර දැක්වූවන් පැවසුවේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සිටියා නම් ඔවුන්ගේ නිෂ්පාදන මට්ටම් තවදුරටත් ඉහළ මට්ටමක් දක්වා වැඩි කර ගැනීමට හැකියාව තිබූ බවයි.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.3** | **60.4** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 55.5 | 61.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 49.0 | 58.2 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 53.5 | 57.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 49.0 | 56.6 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 65.0 | 67.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, නව ඇණවුම් වල සිදුවූ වර්ධනය සහ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීමේ අපේක්ෂාව සමඟ තොග මිලදී ගැනුම් ඉහළ යන ලදී. සැපයුම් දාමයේ ගැටළු සැලකිල්ලට ගනිමින් තොග මිලදී ගැනුම් ඉහළ දැමූ බව ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි සමහර ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2021 ඔක්තෝබර් මාසයේදී ඉහළ යන ලදී. තවද, විශේෂයෙන් ගෝලීය භාණ්ඩ මිල ඉහළ යාම හේතුවෙන් ආනයනික අමුද්‍රව්‍යවල මිල අඛණ්ඩව ඉහළ යාම සැළකියුතු තත්වයක් බව සියලු උප අංශ වල බොහෝ ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.

රට තුළ මෙන්ම ගෝලීය වෙළඳපොළවල ආර්ථික කටයුතු වඩාත් සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන් තව දුරටත් ඉහළ මට්ටමක පවතී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2021 ඔක්තෝබර් මාසයේදී දර්ශකාංක 0.2කින් ඉහළ යමින් 54.3ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2021 ඔක්තෝබර් මාසයේදී ඉන්දියාව, රුසියාව, එක්සත් රාජධානිය සහ චීනයෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ඉහළ ගිය අතර එක්සත් ජනපදය සහ යුරෝපා කලාපයෙහි එම දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 නොවැම්බර් 12 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**57.9**

**2021 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 5.7ක ඉහළ යෑමකි.**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 ඔක්තෝබර් මාසයේ දී 57.9ක දර්ශක අගයක් දක්වා ඉහළ ගිය අතර, ඒ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල ඉහළ යෑම් හේතු විය.** සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි 2021 මාර්තු මාසයෙන් පසු දක්නට ලැබුණු ඉහළම වර්ධන වේගය මෙය වේ.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, ප්‍රවාහන, අධ්‍යාපන, රක්ෂණ, වෘත්තීය සේවා, දේපළ වෙළඳාම සහ විදුලි සංදේශ යන උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ නව ව්‍යාපාර සැප්තැම්බර් මාසය හා සසඳන විට ඔක්තෝබර් මාසයේ දී ඉහළ ගියේය.

සියලුම උප අංශවල පාහේ වර්ධනයන් පෙන්නුම් කරමින් ඔක්තෝබර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකයේ තියුණු වර්ධනයක් දක්නට ලැබුණි. ඒ අනුව, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා, ප්‍රවාහන, අධ්‍යාපන සහ තොග හා සිල්ලර වෙළඳාම යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනයන් දක්නට ලැබුණි. එසේ වුවද, සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින් යෙදවුම් පිරිවැය ඉහළ යෑම සහ ආනයන සම්බන්ධ ගැටළු මධ්‍යයේ සැපයුම කෙරෙහි ඇති බාධා හා ප්‍රමාද හේතුවෙන් තම ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා ඇති බලපෑම් පිළිබඳව අවධාරණය කරන ලදී. තවද, නැව් මගින් භාණ්ඩ ප්‍රවාහනය කරන සමාගම්වල ප්‍රතිචාර දක්වන්නන් විසින් භාණ්ඩ ප්‍රවාහන ධාරිතා සීමා වීම සහ ගාස්තු වැඩි වීම හේතුවෙන් අපනයන පරිමාවන්ට ඇති වන අහිතකර බලපෑම පිළිබඳව ද සඳහන් කරන ලදී.


නව බඳවා ගැනීම් සංඛ්‍යාවට සාපේක්ෂව විශ්‍රාම යෑම් සහ ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත්වීම් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් සේවා නියුක්ති උප දර්ශකය අඛණ්ඩව කඩඉම් මට්ටමට වඩා පහළ අගයක පැවතුණි. මේ අතර, සංචරණ සීමා ලිහිල් කිරීමෙන් පසු කාර්යමණ්ඩලවල බහුතරයක් සේවයට වාර්තා කිරීම හේතුවෙන් 2021 මාර්තු මාසයෙන් පසු පළමු වරට ඔක්තෝබර් මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් පහළ ගියේය.

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **52.2** | **57.9** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **උපදර්ශක** | | | | |
| නව ව්‍යාපාර | 54.0 | 58.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 46.5 | 66.2 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 40.3 | 45.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 54.8 | 49.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 65.6 | 70.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත සීමා ලිහිල් කිරීම සහ එළඹෙන උත්සව සමයේ ඇතිවියහැකි ඉල්ලුමේ වැඩිවීම පිළිබඳ හිතකර අපේක්ෂාවන් හේතුවෙන් ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ඔක්තෝබර් මාසයේ දී ඉහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි තවදුරටත් ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 සැප්තැම්බර් මාසයේ පැවති 53.8 සිට 2021 ඔක්තෝබර් මාසයේ දී 55.6 දක්වා ඉහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව, ජපානය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 ඔක්තෝබර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 නොවැම්බර් 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.